## බලාපොරොත්තුවන්න

ඔබ සඳහා සකස් වූ

ඔබ වෙනුවෙන් කැප වූ

සඟරාවක්

මංගල කලාපය ලබන ඔක්තෝබර් මාසයේදී

කලවිළිට බසිනු ඇත.


ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

33, මල්බාන්ක් පාර,

කොළඹ - 5.



ගොවිකටයුතු පර්යේෂණ

හා

පුහුණුකිරීමේ ආයතනය.



# හම්බවන්නේ ක්ෂේත්‍ර මධ්‍යස්ථානය ගොවීන්ට උපකාරවන්නේ කෙසේද



2009/06

2010/04

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පිහිටුවන ලද්දේ දැනට අවුරුද්දකට මඳක් ඉහතදී. එය කැප වී සිටින්නේ ගොවීන්ගේ ප්‍රශ්න ගැන සොයා බලන්න. සාර්ථක ගොවියෙක් වෙන්න ඔබට උවමනා කරන්නේ හොඳ ඉඩම් පමණක් නොවෙයි. ඒ වගේම වඩා හොඳ බීජ හෝ සතුන්, එහෙමත් නැත්නම් උවමනා තරම් පෝර යන මේවා පමණක් නොවෙයි. වෙනත් උපකාරක සේවාවන් - ඒ කියන්නේ ණය පහසුකම් සහ උපදෙස් වැනි ගොවිතැනට සම්බන්ධ නොයෙක් දේවල් - ගණනාවක්ම උවමනායි. මේ කියන උපකාරක සේවාවන් ක්‍රියා කරන හැටි සොයා බලා, ඒවා වැඩි දියුණු කරන්න ඕනෑ මොන මොන තැන්වලදීද, කොයි පිළිවෙලටද යන්න ගැන පරීක්ෂා කිරීම තමයි අපේ අරමුණ.

බැමිණිවත්තේ තිබෙන මේ මධ්‍යස්ථානය මූලික වශයෙන් කරුණු තුනක් ගැන උනන්දු වෙනවා. පළමුවෙනිම, ඔබ වගා කරන ඉඩමත් ඔබත් අතර තිබෙන සම්බන්ධය, ඒ කියන්නේ ඉඩම් බුක්ති ක්‍රමය ගැන සොයා බලනවා. ඔබ සමහරවිට තමන්ටම අයිති ඉඩමක වගා කරන්නෙක් වෙන්න පුළුවනි. එසේ නැත්නම් අන්දෙට හෝ තට්ටුමාරු, කට්ටිමාරු වගේ වෙනත් පිළිවෙලකට වගා කරන්නෙක් වෙන්න පුළුවනි. මේ වගේ සමහර ක්‍රමවලින් ඉඩමේ පලදාව අඩු වෙනවා විතරක් නොවෙයි, ගොවියා වන ඔබට මහන්සියට සරිලන තරම් ආදායමක් නොලැබෙන්නත් පුළුවනි. ඔබ වගා කරන ඉඩම්වල අයිතිය කොයි අන්දමේ එකක්ද, ඒ තත්වය ඔබටත්, ඔබේ මහන්සියට ලැබෙන අස්වැන්න ප්‍රමාණයටත් කොයි ආකාරයකින් බල පානවාද යන මේ කාරණය ගැන අපේ ආයතනය සැලකිල්ලක් දක්වනවා.

23066

23066

පු.අං

දෙවනුව, ගොවිපලෙන් ඔබ ලබා ගන්නා ප්‍රයෝජනය – වෙනත් වචනවලින් කියනවා නම් ගොවිපලේ නිෂ්පාදන තත්වය – ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ඒ කාලයට ඔබින බෝග වර්ග වගා කිරීමෙනුත්, සුදුසු සතුන් වර්ග ඇති කිරීමෙනුත්, එහෙම නැත්නම් මේ දෙකම කළවම් කිරීමෙන් ඔබ ගොවියකු වශයෙන් නියම පල ප්‍රයෝජන ලබනවාද? කෙටියෙන් කියනවා නම් ඔබේ ඉඩමෙන් ලබා ගන්න පුළුවන් ඉහළම ආදායම ලැබෙනවාද යන වගයි.

තුන් වෙනුව, ගොවියෙකු වශයෙන් ඔබට කලින් කියාපු උපකාරක සේවාවන් ගණනාවක්ම අවශ්‍ය වෙනවා. ඔබට උවමනා කරන බීජ, පෝර, කෘෂිරසායන බෙහෙත් වැනි දේවල් ලබා ගන්න ණය පහසුකම් අවශ්‍යයි. වගා කිරීම පිළිබඳ අළුත් ප්‍රශ්නයක් මතු වුනාම ඒ ගැන කරුණු දැන ගැනීමට දැනුමක් ඇති කෙනෙකුගේ උදව්ව අවශ්‍ය වෙනවා. අස්වැන්න එකතු කර ගත්තාට පස්සේ ඒවා විකුණන්න පුළුවන් තැනකට ගෙන යන්න ඕනෑ. ඒ සඳහා වාහන පහසුකම් උවමනා වෙනවා. ඒ වගේම ඔබේ අස්වැන්නවලට සාධාරණ (හොඳ) මිලක් ලබා ගැනීම ඉතාම වැදගත්. මේ වගේ අවශ්‍ය දේවල් ඔබට උවමනා වෙලාවට ලැබෙනවාද? ඔබේ ගොවිපල සාර්ථක අන්දමින් පවත්වාගෙන යන්නට නම් මේ පහසුකම් හැම එකක්ම අවශ්‍යයි. අපේ ආයතනය මේ හැම කාරණයක් ගැනම හොඳින් සොයා බලා ඒවා ක්‍රියාත්මක වෙන අන්දම ගැන පරීක්ෂා කිරීමටත් කටයුතු කරනවා.

ඔබේ ප්‍රශ්න හා අමාරුකම් ගැන එකින් එක ඔබ ඒවාට මුහුණ දෙන ආකාරයෙන්ම පරීක්ෂා කර බැලීමට හොඳ අවස්ථාවක් බැම්බිවත්ත මධ්‍යස්ථානය නිසා අපේ ආයතනයට ලැබෙනවා. කෘෂි

සේවා මධ්‍යස්ථානයට අයිති බල ප්‍රදේශය සම්පූර්ණයෙන්ම බැම්මිවත්ත මධ්‍යස්ථානය විසින් සේවය කරන පලාතට ඇතුලත් වෙන අතර, පවුල් හත් අට දාහක් පමණ එහි පදිංචි වී සිටිනවා. එයින් වැඩි කොටස ඔබේ පවුල වැනි ගොවි පවුල්. අපේ ආයතනයේ නිලධාරි මහත්වරු බැම්මිවත්තට නිතර නිතර ඇවිත් ඒ පලාතේ පදිංචි ගොවි පවුල් ගණනාවක් කිට්ටුවෙන් හඳුනා ගන්නවා ඇති. ඔබ හැම කෙනෙක්මත්, පලාතේ සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන්වත් නම් වශයෙන් අඳුනා ගන්න තමයි අප වෑයම් කරන්නේ. ඒ මාර්ගයෙන් අපට පුළුවන් වෙනවා එක එක සේවාවන් ක්‍රියාත්මක වෙන හැටි දැක බලා ගන්න.

ඔබේ පලාතට අපේ ආයතනයේ නිලධාරි මහත්වරු එන්නේ ඔබේ මිත්‍රයින් වශයෙන්. එහෙම ඇවිත් ඔබේ ප්‍රශ්න අවබෝධ කරගෙන ඔබත් සමග එකතුවී ඒ ප්‍රශ්න විසඳන්න පුළුවන් ක්‍රම සොයා බලනවා ඇති.

ඔබේ ප්‍රශ්න ගැන සොයා බැලීමට අමතරව අපේ ආයතනයට අයිති තවත් කාර්යයක් තිබෙනවා. ඒ තමයි පුහුණු කිරීමේ කාර්යය. අප විසින් පුහුණු කරන්න බලාපොරොත්තු වෙන්නේ ඔබේ පලාතේ සේවය කරන රජයේ නිලධාරීන්, ගොවි කාරක සභා, සමූපකාර සමිති වැනි ඔබේම සංවිධානවල සාමාජිකයින් සහ ඔබ වැනි ගොවීන් යන අයයි. ගොවීන් වශයෙන් ඔබේ අයිතිවාසිකම් ගැන බල කර සිටීමට පුළුවන් තරමේ සංවිධාන ශක්තිමත් කර ගන්න ඔබට උදව් දෙන්න අපි ලෑස්තියි.

අපේ ආයතනයේ අය ඔබ දුණ ගැසෙන්න එන්නේ ඔබේ ප්‍රශ්න හැම එකක්ම දන්නවා යන අදහසක් ඇතුව නොවෙයි. ඒ

වගේම ඔබේ ප්‍රශ්න සඳහා සහන පිළියම් අපේ අතේ නොවෙයි. කෙසේ වෙතත් අපි අදහස් කරන්නේ මෙන්න මේකයි. ඔබ සමඟ ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කර, ඔබේ ප්‍රශ්න ගැන ඉතාමත් සුහද ලීලාවෙන් ඔබ සමඟ කතා බස් කර, අඩු ගණනේ ඔබේ අමාරුකම් ටිකක් ගැනවත් පිහිට වෙන්නයි. මේ ආකාරයෙන් අපට පුළුවන් වෙනවා ශුභත් ප්‍රයෝජනවත් තොරතුරු රාශියක් එකතු කර ගන්න. ඔබේ ප්‍රශ්නවලට බොහෝදුරට සමාන ප්‍රශ්න ඇති මේ රටේ වෙනත් පලාත්වල ඉන්න ගොවීන්ට මේ තොරතුරු ප්‍රයෝජනයට ගන්න පුළුවනි. අපි අදහස් කරනවා කලින් කල වෙන පලාත්වලින් ගොවීන් කණ්ඩායම් වශයෙන් බැප්පිලිවත්තට කැඳවාගෙන එන්න. ඒ මාර්ගයෙන් ඔවුන්ට අවස්ථාවක් ලැබෙනවා ඔබ මුණ ගැසී ඔබේ ප්‍රශ්න ගැන කතා බහ කරන්නත්, ඔබ ඒ ප්‍රශ්න විසඳන ආකාරය දැක බලා ගන්නත්. සමහරවිට ඒ අයගේ ප්‍රශ්න විසඳා ගත්තු පිළිවෙල ගැන යමක් කියන්න ඔවුන්ට පුළුවන්කමක් ඇති. මේ ආකාරයෙන් රටේ වෙන පලාත්වල ඉන්න ගොවීන් සහ බැප්පිලිවත්තේ ගොවීන් අතර සම්බන්ධතාවක් ඇති වෙනවා.

අපේ මධ්‍යස්ථානය ඔබේ පලාතේ ගොවිකම් පලදා වර්ධන කමිටුව සමඟ ඉතා කිට්ටු සහයෝගයකින් වැඩ කරනවා ඇති. ගොවිකම් පලදා වර්ධන කමිටුව පිහිටුවන්නේ ඔබේ පලාතේ ගොවිතැන් කටයුතු සම්බන්ධ බීජ, වගාකම් ගැන සොයා බලන්නයි. ඒක ඔබ දන්න කාරණයක්. ඔබේ ඉඩමේ පලදාවත්, ඒ මගින් ඔබේ ආදායමත් දියුණු කරන්නටයි මේ කමිටුවේ බලාපොරොත්තුව. ලඟදී රාජ්‍ය සභාවේ සම්මත වුන අලුත් ගොවිකම් පලදා වර්ධන පනත යටතේ තමයි මේ කමිටුව පත් කරන්නේ.

ගොවිකම් පලදා වර්ධන කමිටුව ක්‍රියා කරන්නේ ලඟදීම ඔබේ පලාතේ පිහිටුවන්නට යන කෘෂි සේවා මධ්‍යස්ථානයේ සිටය්. මේ අළුත් මධ්‍යස්ථානය ඔබේ පලාතේ හැම ගොවියෙකුටම ලොකු වාසියක්. නමුත් එසේම වෙන්නේ ඒ මධ්‍යස්ථානයෙන් සලස්වා දෙන සේවයෙන් ඉහළම ප්‍රයෝජන ගන්නට පුළුවන් ක්‍රමය දැන ගෙන සිටියොත් පමණයි. ගොවිකම් පලදා වර්ධන කමිටුවට ඔබ අතරින් තේරී පත් වූන සාමාජිකයෝ මේ මධ්‍යස්ථානයේදී රජයේ එක එක දෙපාර්තමේන්තුවල නිලධාරීන් සමඟ වැඩ කරනවා ඇති. කෘෂිකම් දෙපාර්තමේන්තුව, කෘෂිකම් හා ඉඩම් අමාත්‍යාංශයේ ග්‍රාමීය ආයතන අංශය, සමූපකාර දෙපාර්තමේන්තුව හා ලංකා බැංකුව වැනි නොයෙකුත් ආයතනවලට අයිති නිලධාරීන් සමඟයි ඔබේ නියෝජිතයෝ වැඩ කරන්නේ. එසේ කරන්නේ පලදාව වැඩි කර ගැනීමට උවමනා කරන හැම සේවයක්ම එකම වහලක් යට පවත්වාගෙන යාමටයි. මේ මධ්‍යස්ථානය පිහිටුවා තිබෙන්නේ හැම ගොවියෙකුටම පහසුවෙන් යන්න එන්න පුළුවන් තැනක. කලින් කියාපු අළුත් නීතිය සම්බන්ධ උපදෙස් හා තොරතුරු ලබා දෙන්නත්, පෝර, වල් පැලෑටි නාශක බෙහෙත් සහ ණය පහසුකම් වැනි ගොවිතැනට උවමනා කරන නොයෙකුත් දේවල් කරදරයක් නැතුව ලබා ගන්නටත් මේ මධ්‍යස්ථානය උදව් දෙයි. මේ මධ්‍යස්ථානයේ වැඩ කරන නිලධාරී හැම කෙනෙක්ම ඔබට පුද්ගලිකව මුණ ගැසී ඔබට උවමනා කරන උපදෙස් දෙන්නට ඕනෑම වෙලාවක සූදානම්.

අපේ එලිමහන් අධ්‍යයන හා පුහුණු කිරීමේ කටයුතු කෙරෙන ප්‍රදේශයේ මූලස්ථානය වශයෙන් මේ මධ්‍යස්ථානයේ අපටත් කොටසක් වෙන් කෙරෙනු ඇත. අපේ නිලධාරි මහත්මරු ඔබට සහ මේ මධ්‍යස්ථානයේ වැඩ කරන නිලධාරීන් හැම දෙනාටම

මුණ ගැසී ඉතාමත් කිට්ටුවෙන් හඳුනාගෙන ඔබේ ප්‍රශ්න මොනවාදැයි දැන ගන්නවා ඇති. ඒ වගේම ඔවුන් ඔබේ ගොවිපලට ඇවිත් නොයෙක් මාදිලියේ හැදෑරුම් කරාවි. මේ නිසා දැන් ඔබට එක කාරණයක් පැහැදිලිව පෙනෙනවා ඇති. එනම්, අපේ කේන්ද්‍ර මධ්‍යස්ථානයත් ඔබේ පලාතේ ගොවිකම් පලදා වර්ධන කමිටුවත් යන මේ දෙක ඔබේ ගොවිතැන් කටයුතුවලට ඉතාමත් කිට්ටුවෙන් සම්බන්ධ වෙන බවයි.

ඔබේ ගමේ ගොවි කාරක සභාව දැන් වෙනස් කෙරිගෙන යනවා. මීට පස්සේ එහි කටයුතු කුඹුරුවලට පමණක් සීමා වෙන්නේ නැහැ. ඒ අය ගොවිකම් පලදා වර්ධන කමිටුවේ නියෝජිතයින් වශයෙන් මින් ඉදිරියට ගොඩ ඉඩම්වල පලදාව වැඩි කරන්නටත් ඔබට උදව් වේවි.

කොටින් කියනවානම් කෘෂි සේවා මධ්‍යස්ථානයත්, ගොවිකම් පලදා වර්ධන කමිටුවත් ගොවිතැනට උවමනා කරන දේවල් නොකඩවා ලබා දෙන්න උත්සාහ කරන අතර, ගොවිපලවල් නියම තත්වයක තබා ගැනීම සම්බන්ධයෙනුත් වග බලා ගන්නවා ඇති. අපේ කේන්ද්‍ර මධ්‍යස්ථානය තිබෙන ප්‍රදේශයේ ගොවිතැනට උවමනා කරන දේවල් සැපයීම සම්බන්ධයෙන් මතු වෙන ප්‍රශ්න ගැන ගැඹුරු විදියට සොයා බලන්න අපි අදහස් කරනවා. ඒ වාගේම ඔබේ ගම්වල තිබෙන සමිති සමාගම් සාර්ථක ලෙස වැඩ කරනවාද යන්න ගැනත් විපරම් කරනවා. මෙයින් අපි අදහස් කරන්නේ රජයේ එක එක ආයතන මඟින් කරන්න පුළුවන් පිළියම් මොනවාද කියා පෙන්වා දෙන්නටයි.

අප ගන්න හැම උත්සාහයකදීම ඔබේ උදව්වත්, සහයෝගයත් නිතරම අපට ලැබෙනවා ඇතැයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
33, එළිබැන්ක් පාර,
කොළඹ 5.

1973 අගෝස්තු 18 වනදා.